අම්පාර නගර සභාව
අම්පාර දිස්ත්‍රික්කය
-----------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 09 වැනි දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 08 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 06 දින සභාවේ සභාපතිවරයාට යවන ලදි.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට අම්පාර නගර සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

2014 ජනවාරි 27 දිනැති අංක පීඑල්/05/බීජ්/ශ්‍රීලරාඅගිප්‍ර දරන පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට කඩකුලි ලේඛණය අනුව හිඟ කඩ කුලි ආදායම රු.286,341 ක් වුවත්, එය ශේෂ පත්‍රයේ රු.259,742 ක් ලෙස රු.26,599 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට දේශිය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු හිඟ ණය වාරික වල වටිනාකම රු.210,817 ක් ශේෂ පත්‍රයේ වගකීම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) ණයහිමි ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය හිමි (පොදු සැපයුම්) ශේෂය රු.1,860,592 ක් වුවද එය ශේෂ පත්‍රයේ රු.362,127 ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් ණය හිමියන් රු.1,498,465 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ආදායම් ලෙජරයට අනුව සමාලෝචිත වර්ෂයේ කඩකුලී ආදායම රු.3,063,630 ක් වූවද ආදායම් වියදම් ගිණුමට ගෙන තිබුනේ රු.3,236,266 ක් ලෙසය. මේ නිසා කඩකුලී ආදායම රු.172,636 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු ආදායම රු.8,958,133 ක් වූවද ආදායම් වියදම් ගිණුමට ගෙන ඇත්තේ රු.7,046,434 ක් ලෙසය. එම නිසා වරිපනම් හා බදු ආදායම රු.1,911,696 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

---

ආයෝජන රු.80,306ක් සම්බන්ධයෙන් ආයෝජන සහතික සහ ආයෝජන පොලි ලේඛණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

(අ) කාය වර්ධන මධ්‍යස්ථානයට භාණ්ඩ ලබා ගැනීමට සහ උපකරණ සඳහා ගෙවීම් කිරීමට ලබා දී ඇති රු.1,992,300 ක අත්තිකාරම් පියවා නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට රු.65,770 ක් වූ මුද්දර බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.5 අවිනිශ්චිත ගිණුම්

---

2013 දෙසැම්බර් 31 දිනට රු.5,450 ක ශේෂයක් අවිනිශ්චිත ගිණුමේ පෙන්වන අතර එය නිරවුල්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 411,022 ක් වූ අතර, ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,330,220 ක් විය. මේ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,741,242 ක පසුබෑමක් පෙන්නුම් කෙරේ.

### 2.2 ආදායම් පරිපාලනය

--------------------------

#### 2.2.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

2013 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් රු.184,333 ක උසාවි දඩ සහ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.900,155 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව ඇති අතර එම මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

පහත සඳහන් මෙහෙයුම් අකාර්යක්ෂමතා නිරික්ෂණය විය.

(අ) සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් රු.5,455,994 ක ණය මුදලක් ලබාගෙන තිබුනු අතර, එම ණය මුදලට අදාල පොලිය සහ වාරික නොගෙවීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට හිඟව ඇති ණය ප්‍රමාණය රු.3,471,269 ක් සඳහා රු.1,207,079 ක පොලි මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවට වාරික වශයෙන් යැවිය යුතු එකතුකල අගය මත බදු මුදල් (VAT) 2009 වර්ෂයේ සිට ප්‍රේෂණය නොකර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.4,139,649 ක් තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

### 4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් සහ තත්‍ය වියදම අතර සියයට 10 සිට සියයට 107 දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛණයේ සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනය

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් අයකර ගැනීම